දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේඅංකය )
எனது இல )
My No. ) FHB/CNU/01/Gen/2022

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )
Date ) 13.11.2022

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ අංක:** 01-13/2020(i)

**සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්**
**සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්**
**සියලුම ආයතන ප්‍රධානීන්**
**සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්**

**"වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහ මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය කළමනාකරණය - ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අත් පොත" යන 01-13/2020 පොදු චක්‍රලේඛයට වැඩිමනත් ලෙස නිකුත් කෙරෙන අතිරේක උපදෙස් මාලාව**

**"වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ තීව්‍ර මන්දපෝෂණය (කෘශ බව) වැලැක්වීම සහ කළමනාකරණය"**

වර්ධනය ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරන ජාතික මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහන යටතේ ඇති එක් ප්‍රධාන ක්ෂේත්‍රයක් වේ. දැනට මෙම වැඩසටහන හරහා අවුරුදු 5ට අඩු දරුවන්ගේ පෝෂණ ගැටලු පූර්ව ප්‍රාථමික, ප්‍රාථමික හා ද්විතියික මට්ටමින් වැළැක්වීම සඳහා (primordial, primary and secondary prevention) වර්ධනය ඇගයීමේ හා ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් මාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක කෙරේ. ද්විතියික වළක්වා ගැනීමේ පියවරක් වන පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන (NRP) වශයෙන් ද හඳුන්වනු ලබන අවුරුදු 5ට අඩු දරුවන්ගේ මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය (MAM) සහ උග්‍ර තීව්‍ර මන්දපෝෂණය (SAM) කළමනාකරණය මෙම වැඩසටහනේ ඉතා වැදගත් හා අනිවාර්ය අංගයකි.

වත්මන් වැඩසටහන් ආවරණය තව දුරටත් වැඩි දියුණු වියයුතු බව මෙන්ම වර්තමානයේ රට මුහුණ පා ඇති ආර්ථික අර්බුදය ද සැලකිල්ලට ගනිමින්, දැනට සිදු කෙරෙන වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ වර්ධනය තක්සේරු කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ සුපුරුදු ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා අතිරේක ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම කඩිනමින් සිදුකළ යුතු අවශ්‍යතාවක් වී ඇත. එබැවින් අංක 1-13/2020 පොදු චක්‍රලේඛය යටතේ "වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ උග්‍ර තීව්‍ර මන්දපෝෂණය සහ මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය කළමනාකරණය - ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අත් පොත" සඳහා වූ මාර්ගෝපදේශයට වැඩිමනත් ලෙස මෙම "අවුරුදු 5ට අඩු දරුවන්ගේ තීව්‍ර මන්දපෝෂණය කළමනාකරණය සහ වළක්වා ගැනීම" පිළිබඳ මෙම අතිරේක උපදෙස් මාලාව (අමුණා ඇත) නිකුත් කරනු ලැබේ.

**මෙම අතිරේක උපදෙස් මාලාව නිකුත් කිරීමේ අරමුණු නම්**

1. වර්ධනය තක්සේරු කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම තුලින් කෘශ වීමේ අවදානම කල්තියා හඳුනා ගෙන එමගින් කෘශ වීම වළක්වා ගැනීම සහ ප්‍රජා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් කෘශ දරුවන් හඳුනාගෙන යොමු කිරීම/ විධිමත් කළමනාකරණය/ පසු විපරම් සිදු කිරීම වැඩිදියුණු කිරීම
2. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී මට්ටමින් මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම
3. ප්‍රාථමික සත්කාර සේවා මට්ටමේ ආයතනවල (දිස්ත්‍රික් රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක - DH/PMCU) විශේෂඥ ජංගම සායන (outreach clinics) ස්ථාපිත කිරීම සහ පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන පිළිබඳ

තොරතුරු පද්ධතිය විධිමත් කිරීම මගින් උග්‍ර තිව්‍ර මන්දපෝෂණය සහිත දරුවන් යොමු කිරීම සහ ප්‍රතිකාර සඳහා යොමු වීම වැඩි දියුණු කිරීම, ප්‍රතිකාර හැර යන්නන් අවම කිරීම.

4. ප්‍රාථමික සත්කාර සේවා මට්ටමේ ආයතන (දිස්ත්‍රික් රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක - DH/PMCU) සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් රෝහල්වල බාහිර රෝගී අංශවලට පැමිණෙන දරුවන් සඳහා රෝගී වූ විට ආහාර දීම පිළිබඳ උපදේශනය වැඩි දියුණු කිරීම.

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති "වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ උග්‍ර තිව්‍ර සහ මධ්‍යස්ථ තිව්‍ර මන්දපෝෂණය කළමනාකරණය - ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අත් පොත" මෙන්ම ඊට වැඩිමනත් වශයෙන් නිකුත් කෙරෙන මෙම **"වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ තිව්‍ර මන්දපෝෂණය වැළැක්වීම සහ කළමනාකරණය"** අතිරේක උපදෙස් මාලාව ද උපරිම ලෙස භාවිතයට ගන්නා ලෙස රෝගී සත්කාර සහ නිවාරණ යන දෙඅංශයේම සිටින සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

මෙම අතිරේක උපදෙස් මාලාව (අමුණා ඇත) ඔබ යටතේ සිටින සියලුම ආයතනික සහ ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ අවධානයට යොමු කිරීමට කටයුතු කරන ලෙසත්, දරුවන්ගේ පෝෂණ තත්ත්වය කෙටි කාලීනව සහ දීර්ඝ කාලීනව ආරක්ෂා කිරීම ඉලක්ක කර ගනිමින් මෙම උපදෙස්මාලාව ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම සහතික කිරීමට අවශ්‍ය සියලුම පියවර ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටිමි.

වැඩි විස්තර සඳහා:
**වෙබ් අඩවිය :**
***http://fhb.health.gov.lk/index.php/en/technical-units/child-nutrition-unit***
**SAM & MAM Management Resource Folder:**
***https://drive.google.com/drive/folders/1JeyATdZeLBKmsNvjdUGtbZJan11pt65R?usp=sharing***

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්;

ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය
අතිරේක ලේකම් - මහජන සෞඛ්‍ය සේවා
අතිරේක ලේකම් - වෛද්‍ය සේවා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - මහජන සෞඛ්‍ය සේවා 1 සහ 11
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - වෛද්‍ය සේවා 1 සහ 11
අධ්‍යක්ෂ - මාතෘ හා ළමා සෞඛ්‍ය
අධ්‍යක්ෂ - වතු සහ නාගරික සෞඛ්‍ය
අධ්‍යක්ෂ - පෝෂණ
අධ්‍යක්ෂ - සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රචාරණ
ප්‍රධාන වසංගතවේද විද්‍යාඥ
අධ්‍යක්ෂ - පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර ස්වස්ථතා
අධ්‍යක්ෂ - බෝ නොවන රෝග
අධ්‍යක්ෂ වෛද්‍ය පර්යේෂණ ආයතනය
අධ්‍යක්ෂ වෛද්‍ය සැපයුම්
අධ්‍යක්ෂ පෞද්ගලික වෛද්‍ය අංශ සංවර්ධන
අධ්‍යක්ෂ වෛද්‍ය සේවා
සියළුම වෛද්‍ය විද්‍යාල පීඨාධිපතිවරුන්
සභාපති / ශ්‍රී ලංකා ළමාරෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්වත් සංගමය
සභාපති / ශ්‍රී ලංකා පෝෂණ වෛද්‍යවේදීන්ගේ සංගමය
සභාපති / ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය
සභාපති / ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලන සංගමය
සභාපති / ශ්‍රී ලංකා පවුලේ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය
සභාපති / ශ්‍රී ලංකා ස්වාධීන වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යායතනය
සභාපති / ශ්‍රී ලංකා පෝෂණ සංගමය

**පොදු චක්‍රලේඛ අංක. 01-13/2020 (i)**

**"වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහ මධ්‍යස්ථ තීව්‍ර මන්ද පෝෂණය කළමනාකරණය - ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අත් පොත" යන 01-13/2020 පොදු චක්‍රලේඛයට වැඩිමනත් ලෙස නිකුත් කෙරෙන අතිරේක උපදෙස් මාලාව**

**"<u>වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ තීව්‍ර මන්ද පෝෂණය (කෘශ බව) වැළැක්වීම සහ කළමනාකරණය</u>**

මෙම උපදෙස්මාලාවේ අරමුණ වන්නේ සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ අංක 1-13/2020 දරන "වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ උග්‍ර තීව්‍ර මන්ද පෝෂණය සහ මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය කළමනාකරණය - ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අත් පොත" යන මාර්ගෝපදේශයේ සපයා ඇති උපදෙස්වලට අමතරව ආයතනික සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ඇතුලු අදාළ සෞඛ්‍ය බළධාරින්ට සේවාවන් සංවිධානය කරගැනීම සඳහා අතිරේක වශයෙන් අවශ්‍ය මග පෙන්වීම ලබා දීමයි.

1. **වර්ධනය තක්සේරු කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම තුලින් කෘශ වීමේ අවදානම කල්තියා හඳුනා ගෙන එමගින් කෘශ වීම වළක්වා ගැනීම සහ ප්‍රජා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් කෘශ දරුවන් හඳුනාගෙන යොමු කිරීම/ විධිමත් කළමනාකරණය/ පසු විපරම් සිදු කිරීම වැඩිදියුණු කිරීම**

   වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ වර්ධනය තක්සේරු කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනේ අරමුණ වන්නේ මධ්‍යස්ථ/උග්‍ර කෘශ බවට හෝ අධිබර/ස්ථුල බවට පත් වීමත් දිගු කාලීන වර්ධනය අඩාල වීම නිසා මිටි බවට පත් වීමත් වැළැක්වීම සහ කල්තියා හඳුනා ගැනීම මගින් දරුවන්ගේ වර්ධනය සහ පෝෂණය ප්‍රශස්තව පවත්වා ගැනීමයි. පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනේ අරමුණ වන්නේ මධ්‍යස්ථ කෘශ බවට/උග්‍ර කෘශ බවට පත් වූ දරුවන්ගේ පෝෂණ තත්ත්වය යථා තත්ත්වයට පත්කිරීමයි.

   - මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මගින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශවල ක්‍රියාත්මක කරන වර්ධනය තක්සේරු කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන තව දුරටත් ශක්තිමත් කිරීම සහ වඩාත් කැපවීමෙන් සහ උනන්දුවෙන් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍යය. වයසට අදාළ බර ප්‍රස්තාරයේ වර්ධන රටාව සාමාන්‍ය වර්ධන රටාවෙන් අපගමනය වීම (කෘශවීමේ අවදානම සහ අධිබරට අවදානම) ආරම්භ වන අවස්ථාවේදීම හඳුනාගැනීමට සහ මෙම අපගමනයන් කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

     මේ අනුව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන්ගේ ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථානවල ප්‍රධාන වගකීම් වනුයේ:

     a) ප්‍රශස්ත වර්ධනයක් පවත්වා ගැනීමට සහය වීම.

     b) වර්ධනය අඩාල වීම (හෝ අධිබර ප්‍රවණතාවය) මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීම සහ හඳුනාගත් අවස්ථාවේදීම සුදුසු මැදිහත්වීම් සිදු කිරීම.

        වයසට අදාළ බර ප්‍රස්තාරයේ වර්ධන රටාව සාමාන්‍ය වර්ධන රටාවෙන් අපගමනය වීම ආරම්භක අවස්ථාවේදීම හඳුනා ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. (මෙය බහුතරයක් ළමයින්ගේ වර්ධනය අඩාල වීම හෝ "කෘශ වීමේ අවදානම"ක් වන අතර සමහරක් දරුවන් "අධිබරට අවදානම"ක් ලෙස දැක්විය හැකි ඉහළ අතට සිදුවන අපගමනයක්ද පෙන්නුම් කළ හැක.) දරුවන්ට ආහාර දීමේ නිර්දේශ භාවිත කරමින් පෝෂණ උපදේශනය සහ අනෙකුත් අදාළ මැදිහත්වීම් ඔස්සේ මෙම ප්‍රවනතාවයන් නිවැරදි කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය.

        පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් විසින් දරුවකුගේ වර්ධන රේඛාව සාමාන්‍ය වර්ධන රටාවෙන් අපගමනය වීම ට පටන් ගත් මුල් අවස්ථාවේදීම ඒ බව හඳුනාගෙන මැදිහත් වීම් ඒ අවස්ථාවේදීම වහාම ආරම්භ කළ යුතුය. මෙම දරුවන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීමට නැවතත් මාසයකින් බර කිරා බැලිය යුතුය. මාසයකින් පසුවත් අපගමනයන්හි නිවැරදි වීමක් පෙන්නුම් නොකරයි නම් එවැනි දරුවන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාගේ වැඩිදුර මැදිහත් වීම් උදෙසා නොපමාව ළදරු ළමා සායනය වෙත යොමු කළ යුතුය.

c) මධ්‍යස්ථ/උග්‍ර කෘශබව සඳහා අවදානම (හෝ අධිබරට අවදානම) ඇති දරුවන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ දිග/උස මැනීම මගින් ඒ බව තහවුරු කිරීම, ඉන් පසුව eRHMIS පද්ධතියට ඇතුලත් කිරීම සහ අදාල යොමු කිරීම්/කළමනාකරණය සඳහා ළදරු ළමා සායනවලට යොමු කිරීම.

d) විෂමපෝෂණ තත්ත්වවලින් පෙළෙන දරුවන් පිළිබඳ නිරන්තර පසු විපරම් සිදු කිරීම: උදා:- ප්‍රතිකාර සහ අනෙකුත් උපදෙස් පිළිපැදීම පිළිබඳව, ප්‍රතිකාර පැහැරහැරීම වැළැක්වීම ආදිය සඳහා.

- මෙම සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා CHDR B කොටස, ළදරු/ළමා වර්ධන තත්වය ඇගයීමේ ලේඛනය ඇතුලු වාර්තා නිසි ලෙස නඩත්තු කිරීම අත්‍යවශ්‍ය වේ.

- විශේෂයෙන්ම ක්ෂේත්‍ර බර කිරීමේ මධ්‍යස්ථාන සහ ළදරු ළමා සායන මට්ටමින් මෙම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම ශක්තිමත් කිරීම මෙම සේවාවන්හි ගුණාත්මක බව පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වේ. වර්ධනය අඩාල වීම/අධිබර ප්‍රවණතාවය කල් තියා හඳුනා ගැනීමේ සහ නිවැරදි කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් නව ක්‍රම භාවිත කළ යුතුය. අදාළ තාක්ෂණික අධීක්ෂණ නිළධාරීන්ගේ මග පෙන්වීම යටතේ ප්‍රාදේශීය සහ මාසික සමුළුවලදී මෙම කටයුතු ඇගයීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි මට්ටමින් සිදු කරන නියාමනය සඳහා පහත දර්ශක ද භාවිත කළ හැක.
  *a. මාසයක් තුල බර කිරූ මුළු ළමුන් සංඛ්‍යාවෙන් එම මාසය තුල හඳුනා ගත් වර්ධනය අඩාල වීමේ මුල් අවස්ථාවේ සිටින ළමුන් සංඛ්‍යාව*
  *b. පෙර මාසය තුල හඳුනාගත් වර්ධනය අඩාල වීමේ මුල් අවස්ථාවේ සිටින ළමුන්ගෙන් ඊළඟ මාසය තුලදී එම වර්ධනය අඩාල වීම නිවැරදි වී ඇති ළමුන් සංඛ්‍යාව*

2. **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමින් මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය** (මධ්‍යස්ථ කෘශ - MAM) **කළමනාකරණ කටයුතු විධිමත් කිරීම.**

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සායනවලදී මධ්‍යස්ථ කෘශ දරුවන් කළමනාකරණය කළ යුතුය. මේ සඳහා ආහාර රටාවේ විධිමත් වෙනස් කිරීම් හා සමග මධ්‍යස්ථ කෘශ තත්ත්වයෙන් සුවය ලබන තුරු කෙටි කාලීන අතිරේක ආහාරයක් ලෙස ත්‍රිපෝෂ ලබාදීම කළ යුතුය. මෙම දරුවන් සඳහා මැදිහත්වීම් සුදුසු පරිදි ළදරු ළමා සායනයේදී හෝ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිගේ පෝෂණ සායනයේදී සිදුකළහැකි අතර ගෘහස්ථ මට්ටමින් රැකබලාගන්නන් විසින් එම සියලු උපදෙස් නිසියාකාරයෙන් ක්‍රියාත්මක කරන බවට තහවුරු කිරීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන් විසින් නිරන්තරයෙන් පසුවිපරම් කළ යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි මට්ටමින් කළහැකි සියලු මැදිහත්වීම් සිදු කළ ද මාස 3ක් වන විටත් දරුවාගේ කිසිදු ප්‍රගතියක් නැතිනම් එවැනි දරුවන් වැඩිදුර පරීක්ෂාව සඳහා ළඟම ඇති විශේෂඥ පහසුකම් සහිත රෝහලට යොමු කළ යුතුය.

- ත්‍රිපෝෂ අතිරේක ආහාරය ලබාදිය යුතු මධ්‍යස්ථ කෘශ දරුවන්ගේ ලැයිස්තුවක් අදාල පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියන් සතුව සහ සෑම ළදරු ළමා සායනයකම පවත්වාගත යුතුය.

- මධ්‍යස්ථ කෘශ දරුවන්ගේ ප්‍රගතිය ද ප්‍රාදේශීය සහ මාසික සමුළුවල දී නියාමනය කළ යුතුය. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී මට්ටමින් නියාමනය සඳහා දර්ශක:
  *a. යම් මාසයකදී බර කිරන ලද මුළු ළමුන් සංඛ්‍යාවෙන් කෘශ බව (MAM/SAM) තහවුරු කිරීම සඳහා ළදරු ළමා සායන වෙත යොමු කරන ලද ළමුන් සංඛ්‍යාව*
  *b. යම් මාසයකදී කෘශ බවට අනුමාන කර ළදරු ළමා සායන වෙත යොමු කරන ලද මුළු ළමුන් සංඛ්‍යාවෙන් මධ්‍යස්ථ කෘශ බවට තහවුරු කරන ලද ළමුන් සංඛ්‍යාව*
  *c. රැකවරණය ලබන මුළු මධ්‍යස්ථ කෘශ ළමුන් සංඛ්‍යාවෙන් යම් මාසයකදී සුවය ලැබූ ළමුන් සංඛ්‍යාව*

3. **ප්‍රාථමික සත්කාර සේවා මට්ටමේ ආයතනවල (දිස්ත්‍රික් රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක - DH/PMCU) විශේෂඥ ජංගම සායන (outreach clinics) ස්ථාපිත කිරීම සහ පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන පිළිබඳ තොරතුරු පද්ධතිය විධිමත් කිරීම මගින් උග්‍ර තීව්‍ර මන්දපෝෂණය සහිත දරුවන් යොමු කිරීම සහ ප්‍රතිකාර සඳහා යොමු වීම වැඩි දියුණු කිරීම, ප්‍රතිකාර හැර යන්නන් අවම කිරීම.**

- පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනට ඇතුලත් විය යුතු සියලුම උග්‍ර කෘශ (SAM) ළමුන් හඳුනා ගැනීම සහ කළමනාකරණය සඳහා යොමු කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතුය.
- දරුවා පදිංචි ස්ථානයට ආසන්නවම ඇති ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයකු/සායනික පෝෂණ විශේෂඥ වෛද්‍යවරයකු/ පෝෂණ වෛද්‍යවරයකු විසින් පවත්වනු ලබන ළමා රෝග සායනයකට/රෝහල් පෝෂණ සායනයකට දරුවා යොමු කළ යුතුය; එය ළඟම ඇති විශේෂඥ වෛද්‍යවරයෙකු සිටින රෝහලක ළමා රෝග/පෝෂණ සායනයක් හෝ එවැනි විශේෂඥ වෛද්‍යවරු කුඩා රෝහල්වලට පැමිණ සිදු කරන ජංගම සායනයක් හෝ විය හැක.

- සේවා ලාභීන්ට පැමිණීමේ පහසුව පිණිස දිස්ත්‍රික් රෝහල් /ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකවල (DH/PMCU) මෙම ජංගම ළමා රෝග/රෝහල් පෝෂණ සායන ස්ථාපිත කළ යුතුයි. ඒ තුලින් උග්‍ර කෘශ ළමුන්ගේ යොමු කිරීම්/ප්‍රතිකාර සඳහා පැමිණීම සහ ප්‍රතිකාරවලට අනුගතවීම ද විශේෂඥ ළමා/පෝෂණ ප්‍රතිකාර සඳහා යොමු කරන ලද අනෙකුත් දරුවන් කළමනාකරණය ද ඉහල නැංවීම අපේක්ෂා කෙරේ.

**ජංගම සායන පවත්වන ස්ථාන සහ මාසයකට පැවැත්විය යුතු සායන සැසි සංඛ්‍යාව**

- ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්/ සායනික පෝෂණ විශේෂඥ වෛද්‍යවරුන්/ පෝෂණ වෛද්‍ය නිලධාරීන් සිටින ආයතන කවරේද, අදාල ප්‍රදේශයේ ජංගම සායන ස්ථාපිත කිරීම සඳහා සුදුසු සත්කාරක ආයතන පවතින්නේද, බලාපොරොත්තු වන රෝගීන් සංඛ්‍යාව, ප්‍රජාවේ ස්වභාවය, දෙමාපියන්ගේ/සම්පත් දායකයින්ගේ ප්‍රවාහන පහසුකම් සහ සම්පත් කළමණාකරනය ඇතුලු අනෙකුත් ප්‍රායෝගික කරුණු සැළකිල්ලට ගනිමින් මෙම ජංගම සායන ස්ථාපිත කරන දිස්ත්‍රික් රෝහල් /ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක පිහිටුවිය යුතු රෝහල් කවරේ ද යන්න තීරණය කළ යුතුය.

- හඳුනාගත් සෑම ජංගම සායනයක්ම ළමා රෝග විශේෂඥ, පෝෂණ විශේෂඥ හෝ පෝෂණ වෛද්‍ය නිලධාරීවරයකු සහිත රෝහලක් හා අනුබද්ධ විය යුතුය.

- රෝගීන් සංඛ්‍යාව සහ සම්පත් කළමණාකරනය ඇතුලු අනෙකුත් ප්‍රායෝගික කරුණු මත පැවැත්වෙන ජංගම සායන සැසි වාර ගණන තීරණය කළ යුතුය. අවම වශයෙන් මසකට වරක්වත් මෙම සායන පැවැත්විය යුතුය.

- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ අනුදැනුම ඇතිව සහ අදාළ ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ/ සායනික පෝෂණ විශේෂඥ වෛද්‍යවරුන්ගේ/ පෝෂණ වෛද්‍ය නිලධාරීන්ගේ එකඟතාවයෙන් දිස්ත්‍රික් මාතෘ හා ළමා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් සායන පවත්වන ස්ථාන, දින සහ ප්‍රධාන රෝහලට සහ සෑම ජංගම සායනයකටම සේවා ලාභීන් පැමිණෙන ප්‍රදේශ පැහැදිලිව හඳුනා ගත යුතුය. දරුවන් මෙම සායන වෙත යොමු කිරීම පහසු කිරීම සඳහා එම තොරතුරු අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන්ට දැනුම් දී තිබිය යුතුයි. සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයකම පරිශීලනය සඳහා ප්‍රදේශයේ ළමා රෝග සායන/රෝහල් පෝෂණ සායන ලකුණු කරන ලද (විශේෂඥ සේවා සහිත රෝහල් සහ ජංගම සායන ලකුණු කරන ලද) සිතියමක් පවත්වා ගැනීම වැදගත් වේ. එමෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් මෙම තොරතුරු ඔවුන්ගේ කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කළ යුතු අතර ඔවුන් එය ප්‍රජාවට සන්නිවේදනය කරන බවට සහතික විය යුතුය.

**ජංගම සායන සඳහා ළමුන් යොමු කිරීම**

- උග්‍ර කෘශ දරුවන් සහ ස්ථුල දරුවන් හඳුනා ගත් විගස දරුවාට ආසන්නතම සායනයට (විශේෂඥ සේවා සහිත රෝහල්වල ළමා රෝග සායන /රෝහල් පෝෂණ සායන වෙත හෝ ජංගම සායනයකට) සෘජුවම යොමු කළ හැකිය. අනෙකුත් සංකීර්ණ පෝෂණ ගැටලු සහිත දරුවන් ද

මෙම සායන වෙත යොමු කළ හැකිය. යම් දරුවකුගේ පෝෂණ ගැටලුවට වෙනත් වෛද්‍යමය ගැටලුවක් ද හේතු වී ඇතැයි සැක කෙරේ නම් එවැනි රෝග තත්ත්ව නැති බවට තහවුරු කර ගැනීම සඳහා මුලින්ම ළමා රෝග සායනයක් වෙත යොමු කළ යුතුය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට අමතරව රෝහල් බාහිර රෝගී අංශ, ළමා රෝග සායන සහ රෝහල් පෝෂණ සායන මගින්ද උග්‍ර කෘශ දරුවන් හඳුනා ගත හැක. එලෙස හඳුනා ගන්නා සියලුම දරුවන්ට රෝග විනිශ්චය කළ ස්ථානයෙන් රෝස පැහැති යොමු කිරීම්/ප්‍රතිකාර කාඩ් පතක් (පෝෂණ පුනරුත්ථාපන කාඩ්පත) නිකුත් කළ යුතුය. මෙම කාඩ්පත රැගෙන එන දරුවන්ට ළමා රෝග /පෝෂණ සායන හෝ ජංගම සායන සඳහා සෘජුවම පැමිණිය හැකි අතර ප්‍රතිකාර සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

**ජංගම සායන මගින් සැපයිය යුතු සේවාවන්**

- යොමු කරන ලද දරුවන්ගේ බර, දිග/උස මැනීම
- උග්‍ර කෘශබව කළමනාකරණය
- වෛද්‍ය සංකූලතා සහිත මධ්‍යස්ථ කෘශබව සහ ස්ථූල බව ඇතුලු අනෙකුත් පෝෂණ ගැටලු කළමනාකරණය
- අතිරේක ආහාර ලබාදීම හෝ ප්‍රතිකාරයන්ට සමගාමීව ආහාර ලබා දීම පිළිබඳ උපදේශනය ද අදාළ පරිදි සිදු කිරීම
- ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් සායනය පවත්වන්නේ නම් දරුවන්ගේ වෛද්‍ය ගැටලු කළමනාකරණය ද සිදුකළ හැකිය. පෝෂණ විශේෂඥ වෛද්‍යවරයකු හෝ පෝෂණ වෛද්‍ය නිලධාරියකු විසින් ජංගම සායනය පවත්වන අවස්ථාවන්හිදී දරුවාගේ උග්‍රකෘශ බවට හේතුවන රෝග තත්ත්වයක් ඇතැයි සැක කරන්නේනම් එවැනි දරුවන් ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා වෙතට යොමුකළ යුතුය.

**සම්පත් කළමණාකරනය**

- දිස්ත්‍රික් රෝහල්/ප්‍රාථමික සත්කාරක ඒකකයන්හි ආයතන ප්‍රධානීන් සායන පැවැත්වීමට සුදුසු ස්ථානයක්, දරුවන්ගේ බර, දිග/උස මැන බැලීමට සම්මත උපකරණ සහ අවශ්‍යතාවයේ පරිදි සහයක සායනික කාර්ය මණ්ඩලය (උදා:- හෙද නිලධාරී) ලබාදිය යුතුය. යම් හෙයකින් අවශ්‍ය කාර්ය මණ්ඩලය සැපයීමට සායනය පවත්වන ආයතනය අපොහොසත් නම් විශේෂඥ සේවා සපයන රෝහලෙන් අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා දීමට කටයුතු කළ යුතුය.

- ජංගම සායන පැවැත්වීම සඳහා අවශ්‍ය මානව සම්පත්

| මානව සම්පත් | **වගකීම්** |
|---|---|
| ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා / සායනික පෝෂණ විශේෂඥ වෛද්‍යවරයා / පෝෂණ වෛද්‍ය නිලධාරී | සායනය පැවැත්වීමේ සියලු කටයුතු සඳහා මූලික වගකීම දරන අතර උග්‍ර කෘශබව කළමනාකරණය සහ ඖෂධීය ආහාර නිර්දේශ කිරීම. ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයකු විසින් සායනය පවත්වන්නේ නම් දරුවන්ගේ අනෙකුත් වෛද්‍ය ගැටලු කළමනාකරණය |
| හෙද නිලධාරී – 01 | පෝෂණ පුනරුත්ථාපන වැඩසටහන ලියාපදිංචි කිරීමේ ලේඛනය නඩත්තු කිරීම, උග්‍ර කෘශ දරුවන් ලියාපදිංචි කිරීම, බර සහ දිග/උස මැනීම හා අදාළ පරිදි සටහන් කිරීම |
| ඖෂධ සංයෝජක – 01 | ඖෂධීය ආහාර (උදා:- BP100) සහ වෛද්‍යවරයා· නිර්දේශ කරන අනෙකුත් ඖෂධ නිකුත් කිරීම |
| උපස්ථායක– 01 | අනුමත රාජකාරි ලැයිස්තුවට අනුකූලව |
| කම්කරු – 01 | අනුමත රාජකාරි ලැයිස්තුවට අනුකූලව |

දිනකට පැමිණෙන සේවාලාභීන් සංඛ්‍යාව හෝ අනෙකුත් සේවා අවශ්‍යතාවයන් මත මානව සම්පත් වැඩි කළ හැක.

- පැමිණෙන කණ්ඩායමට (සායනය පවත්වන නිලධාරී සහ වාර්තා භාර නිලධාරී, ඖෂධ හා පෝෂණ අතිරේක භාර නිලධාරිවරයා ඇතුලු සහයක සායනික කාර්ය මණ්ඩලය) ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ප්‍රවාහන පහසුකම් සලසා දිය යුතුය. සෘජුවම සෞඛ්‍ය අමාත්‍යංශය මගින් පාලනය වන රෝහල් සඳහා එම රෝහල් මගින් හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් ප්‍රවාහන පහසුකම් සලසා දිය හැක.

- සායන සංවිධානය කිරීම

  (1) ලියාපදිංචි කිරීමේ ස්ථානය →(2) රැඳී සිටීමේ ශාලාව → (3) බර/දිග/උස මනින ස්ථානය → (4) වෛද්‍ය පරීක්ෂණය සහ පෝෂණ උපදේශනය සිදු කරන ස්ථානය → (5) පිටවීම - පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනේ ලියාපදිංචි කිරීමේ ලේඛනය යථාවත් කිරීම සහ නැවත පැමිණීමේ දිනය ලබා දීම

- උපකරණ සහ ඖෂධ

  i. බර, දිග, උස මැනීම සඳහා නිර්දේශිත උපකරණ
     - ඉලෙක්ට්‍රොනික බර කිරීමේ තරාදිය
       (මෙම උපකරණය ක්‍රමාංකනය සහ සම්මත බර පඩි කට්ටල යොදා ගනිමින් පාඨාංකවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම නිර්දේශිත කාල පරාසයන්හි කළ යුතුය).
     - දිග සහ උස මැනීමේ උපකරණ

  ii. ඖෂධීය ආහාර තොග සහ ජංගම සායන සඳහා අවශ්‍ය අනෙකුත් ඖෂධ ඉල්ලුම් කිරීම සහ නිකුත් කිරීම විශේෂඥ වෛද්‍යවරයා/ සායනික පෝෂණ වෛද්‍ය නිලධාරිවරයා/ පෝෂණ වෛද්‍ය නිලධාරී අනුයුක්ත ආයතනයෙන් සිදු කළ යුතුය. ඖෂධීය ආහාර ඇනවුම් කිරීම සඳහා H 1158 මාසික තොග වාර්තාව උපයෝගී කරගත යුතුය.

  iii. සෑම දරුවෙකුටම ඊළඟ සායන දිනය තෙක් ප්‍රමාණවත් තරම් ඖෂධීය ආහාර (උදා:- BP100) ලබා දිය යුතුය (විශේෂයෙන්ම මසකට වරක් පවත්වන්නේ නම් ඊළඟ ජංගම සායන දිනය තෙක්).

**විශේෂඥ සේවා සහිත රෝහල් සහ/හෝ ජංගම සායන සඳහා සහභාගී වන ළමුන්ව ක්ෂේත්‍රයේදී පසු විපරම් කිරීම.**

- විශේෂඥ සේවා සඳහා යොමු කරන ළමුන් පිළිබඳ (උග්‍ර කෘශබව කළමනාකරණය හෝ ස්ථූල බව වැනි අනිකුත් ගැටලු සඳහා) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් නිරන්තර පසු විපරම් සිදු කළ යුතුය. එම දරුවන් මෙම සායන සඳහා නිසි පරිදි සහභාගී වන බව සහ ප්‍රතිකාර නිසි අයුරින් ලබා ගන්නා බව තහවුරු කළ යුතුය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හැර වෙනත් ආයතන මගින් උග්‍ර කෘශ/එසේ අනුමාන කරන දරුවන් කෙලින්ම ජංගම සායන වෙත යොමු කළ පසු ජංගම සායනයේදී එම දරුවන් උග්‍ර කෘශ ලෙස තහවුරු කළහොත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය මගින් ඔවුන්ගේ ක්ෂේත්‍ර පසු විපරම් සිදු කිරීම සඳහා ජංගම සායනය මගින් එම තොරතුරු අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරයාට දැනුම් දිය යුතුය.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ප්‍රාදේශීය සහ මාසික සමුළුවලදී උග්‍ර කෘශ ළමුන් සඳහා කෙරෙන ක්ෂේත්‍ර පසු විපරම අධීක්ෂණයට ලක් කළ යුතුය. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී මට්ටමින් අධීක්ෂණය සඳහා දර්ශක;
  *a. යම් මාසයකදී බර කිරන ලද මුළු ළමයින් සංඛ්‍යාවෙන් මධ්‍යස්ථ/උග්‍ර කෘශ බවට තහවුරු කිරීම සඳහා ළදරු ළමා සායන වෙත යොමු කරන ලද ළමුන් සංඛ්‍යාව*
  *b. යම් මාසයකදී කෘශ බවට අනුමාන කර ළදරු ළමා සායන වෙත යොමු කරන ලද මුළු ළමුන් සංඛ්‍යාවෙන් උග්‍ර කෘශ බවට තහවුරු කරන ලද ළමුන් සංඛ්‍යාව*

c. *යම් මාසයකදී උග්‍ර කෘශ ලෙස හඳුනා ගත් ළමුන්ගෙන් විශේෂඥ සේවා සඳහා යොමු කරන ලද ළමුන් සංඛ්‍යාව*

d. *යම් මාසයකදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි කොට්ඨාශයක සිටින උග්‍ර කෘශ ළමුන්ගෙන් ඖෂධීය ආහාර (BP 100) ප්‍රතිකාරය ලබන ළමුන් සංඛ්‍යාව*

**දත්ත පද්ධතිය පවත්වා ගැනීම**

- පෝෂණ පුනරුත්ථාපන කාඩ්පත, පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනේ ලියාපදිංචි කිරීමේ ලේඛනය, පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනේ මාසික සංක්ෂේපය සහ H1158 මාසික තොග වාර්තාව යන උග්‍ර කෘශ බව පිළිබඳ තොරතුරු පද්ධතිය හරහා නිසි කලට තොරතුරු ලබාදිය යුතුය.

- උග්‍ර කෘශ දරුවකු හඳුනා ගත් අවස්ථාවේදීම යොමු කිරීමේ කාඩ්පතක් මෙන්ම ප්‍රතිකාර සහ පසු විපරම් කාඩ්පතක් ලෙස ත් ද්විත්ව අරමුණු ඉටු කරන පෝෂණ පුනරුත්ථාපන කාඩ්පත (රෝස පාට කාඩ්පත) නිකුත් කළ යුතුය. යම් දරුවකු මෙම කාඩ්පතක් නොමැතිව ජංගම සායනයකට පැමිණියහොත් එම දරුවාට සායනයෙන් නව කාඩ්පතක් නිකුත් කළ යුතුය.

- ප්‍රධාන රෝහලේ ළමා රෝග සායනයේ/පෝෂණ සායනයේ සේවා ලාභීන් සඳහා පවත්වා ගෙන යනු ලබන පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනේ ලියාපදිංචි කිරීමේ ලේඛනය එම රෝහලේ කාර්ය මණ්ඩලය විසින් පවත්වන ජංගම සායනවලට ද රැගෙන යා යුතුය. උග්‍ර කෘශ ළමුන් පිළිබඳ වාර්ථා මෙම ලියාපදිංචි ලේඛනයේ පවත්වා ගෙන යා යුතුය.

- ඒ ආකාරයටම විශේෂඥ සේවා සපයන රොහලෙන් සකසන මාසික සංක්ෂේපයේ ('පෝෂණ පුනරුත්ථාපන වැඩසටහනේ මාසික සංක්ෂේපය') ජංගම සායන සඳහා සහභාගි වන ළමුන්ගේ තොරතුරු ද ඇතුලත් විය යුතුය.

- ඖෂධීය ආහාර තොග භාවිතය පිළිබඳ දත්ත H 1158 මගින් නියාමනය විය යුතු අතර එය විශේෂඥ සේවා සපයන ආයතනයේ ප්‍රධාන ඖෂධවේදියා විසින් පිළියෙල කළ යුතුය.

- ජාතික මට්ටමින් පවුල් සෞඛ්‍ය කාර්යාංශය ද දිස්ත්‍රික් මට්ටමින් මාතෘ හා ළමා සෞඛ්‍ය ප්‍රජා වෛද්‍ය විශේෂඥ/වෛද්‍ය නිළධාරි ද අදාල වාර්තා, ලේඛන, ආකෘති සැපයීම සඳහා වගකීම දරයි.

- පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ eRHMIS දත්ත පද්ධතිය මගින් මධ්‍යස්ථ/උග්‍ර කෘශ ළමුන් පිළිබඳ දත්ත පද්ධතිය ද පවත්වා ගෙන යනු ඇත.

4. **ප්‍රාථමික සත්කාර සේවා මට්ටමේ ආයතන (දිස්ත්‍රික් රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක - DH/PMCU) සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් රෝහල්වල බාහිර රෝගී අංශවලට පැමිණෙන දරුවන් සඳහා රෝගී වූ විට ආහාර දීම පිළිබඳ උපදේශනය වැඩි දියුණු කිරීම.**

රෝගී දරුවන්ට වර්ධනය අඩාල වීමේ අවදානමක් ඇති අතර එය නොසළකා හැරියහොත් මධ්‍යස්ථ/උග්‍ර කෘශ තත්වයට පත් වීමට හෝ දිර්ඝ කාලීන වර්ධනය අඩාල වීමට හෝ මිටි බව වැනි වෙනත් පෝෂණ ගැටලු ඇතිවීමට හෝ ඉඩ ඇත. රෝගී දරුවන් බොහෝ විට රෝගී සත්කාරක ආයතනවල බාහිර රෝගී අංශය වෙත පැමිණේ. එම නිසා, බාහිර රෝගී අංශය, රෝගී වූ විට සහ ඉන් සුවය ලබන විට ආහාර දීම පිළිබඳ නිසි උපදේශනය තුළින් රෝගී දරුවන්ගේ වර්ධනය අඩාල වීම වැළැක්වීමට ඇති අනගි අවස්ථාවකි. රෝගාබාධයන් නිසා ඇතිවන වර්ධනය අඩාල වීම මූලාරම්භයේදීම හඳුනා ගැනීමටත් ආහාර දීම පිළිබඳ නිසි උපදේශනය තුළින් එය නිවැරදි කිරීමටත් බාහිර රෝගී අංශයේදී කටයුතු කිරීමට හැකි විය හැක.

## ළමා පෝෂණ ගැටලු වැළැක්වීමේදී බාහිර රෝගී අංශයේ කාර්යභාරය

- බාහිර රෝගී අංශයට දරුවකු පැමිණි සෑම විටම දරුවාගේ ළමා සෞඛ්‍ය සහ සංවර්ධන සටහන්පතේ වර්ධන ප්‍රස්තාර 3 පරීක්ෂා කරන්න. ක්ෂේත්‍ර වර්ධන ඇගයීම් සඳහා දරුවා නියමිත පරිදි රැගෙන යාමට දෙමාපියන්/රැකබලාගන්නන් දිරිමත් කරන්න.
- රෝගී දරුවකු පැමිණි සෑම විටම රෝගී වූ අවස්ථාවේදී ආහාර ලබා දෙන ආකාරය පිළිබඳව විමසන්න. රෝගී තත්වය හේතුවෙන් වර්ධනය අඩාළ වීම වැළැක්වීමට සුදුසු පරිදි උපදේශනය සිදු කරන්න (රෝගී වූ විට ආහාර ලබා දීම පිළිබඳ උපදේශනය).
- දරුවා අසනීපයෙන් සුවය ලබන අවදියේ දී පසු විපරම් සිදු කිරීමට අදහස් කරයි නම් රෝගයෙන් පසුව වයසට නිසි ආහාර රටාවට නැවත හැඩ ගැසීම තහවුරු කිරීම සඳහා සුවය ලබන විට ආහාර ලබාදිය යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා දෙන්න. වර්ධන ප්‍රස්තාර අධ්‍යයනය කර, වර්ධනය අඩාල වීමක් හඳුනා ගතහොත් සුදුසු පරිදි උපදේශනය ලබා දී පසු විපරම් සහ වැඩි දුර රැකවරණය සඳහා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වෙත යොමු කළ යුතුය.

- බාහිර රෝගී අංශය වෙත පැමිණි දරුවෙක් මධ්‍යස්ථ/උග්‍ර කෘශ බවට සැක කළහොත් බර, දිග/උස මැන ඒ බව තහවුරු කිරීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා වෙත යොමු කරන්න. ඉන් පසුව පිළිවෙලින් මධ්‍යස්ථ කෘශබව කළමනාකරණය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා විසින් ද උග්‍ර කෘශ බව කළමනාකරණය ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයා/ සායනික පෝෂණ විශේෂඥ වෛද්‍යවරයා/ පෝෂණ වෛද්‍ය නිලධාරීවරයා විසින් ද සිදු කරයි.

- දරුවකුට උග්‍ර කෘශ බව ඇති බවට අලුතින් තහවුරු කර හඳුනාගත්තේනම්, පෝෂණ පුනරුත්තාපන කාඩ් පතක් නිකුත් කර විශේෂඥ රැකවරණය සඳහා ළඟම ඇති විශේෂඥ පහසුකම් සහිත රෝහල් සායනයට හෝ අදාළ ජංගම සායනයට යොමු කරන්න. ප්‍රතිකාර අතරමග නවතා දැමූ දරුවකු පැමිණියහොත්, නැවත ප්‍රතිකාර ලබා ගැනීමට දිරිමත් කර සුදුසු පරිදි යොමු කරන්න.

- මෙම දරුවන්ගේ ක්ෂේත්‍ර පසු විපරම් සිදු කිරීම තහවුරු කිරීම සඳහා සෑම විටම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාට දැනුම් දෙන්න - මේ සඳහා ළමා සෞඛ්‍ය හා සංවර්ධන සටහන් පතේ යොමු කිරීම් පිටු භාවිත කරන්න. රැකබලාගන්නන්ට ඒ බව දැනුම් දෙන්න.

- දිස්ත්‍රික් මට්ටමින්, බාහිර රෝගී අංශයේ වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා දරුවකුගේ වර්ධන තත්වය හඳුනා ගැනීමට වර්ධන ප්‍රස්තාර අර්ථකතනය කරන ආකාරයත් පෝෂණ උපදේශනයේ මූලික කරුණු පිළිබඳවත්, විශේෂයෙන්ම අසනීප වූ විට ආහාර ලබා දීම පිළිබඳවත් අවශ්‍ය පුහුණුවක් ලබාදීමට කටයුතු කළ යුතුය.

මධ්‍යස්ථ/උග්‍ර කෘශබව කළමනාකරණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු දැන ගැනීම සඳහා මධ්‍යස්ථ සහ උග්‍ර තීව්‍ර මන්දපෝෂණය සහිත වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ වර්ධනය සහ සංවර්ධනය තහවුරු කිරීමට සහ නංවාලීමට සෞඛ්‍ය අමාත්‍යංශය මගින් නිකුත් කළ "වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ උග්‍ර සහ මධ්‍යස්ථ තීව්‍ර මන්දපෝෂණය කළමනාකරණය - සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා අත්පොත" නමැති මාර්ගෝපදේශය භාවිත කරන්න. අත්පොත, අදාල චක්‍රලේඛ සහ ලිපිලේඛන සඳහා පහත වෙබ් සබැඳි භාවිත කරන්න:

**Website:**
http://fhb.health.gov.lk/index.php/en/technical-units/child-nutrition-unit

**SAM & MAM Management Folder:**
https://drive.google.com/drive/folders/1JeyATdZeLBKmsNvjdUGtbZJan11pt65R?ñp=sharing